# පංචායත්, ගම්සභා සහ ශ්‍රී ලංකාවේ පැරණි ග්‍රාමීය පරිපාලන ක්‍රමය පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණයක්

**ආරිය ලගමුව**

## සංක්ෂිප්තය

පොදු සංවර්ධිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන ඒකකය ලෙස ග්‍රාමීය පරිපාලන පද්ධතිය හඳුනාගත හැක. ඉන්දියාවේ පංචායත් ලෙසත් ශ්‍රී ලංකාවේ ගම්සභා (හෙවත් යෝජිත ජනසභා) ලෙසත් ප්‍රකට මෙම ආයතන හරහා පරිපාලන කටයුතු ග්‍රාමීය මට්ටමේ සිට මධ්‍යම ආණ්ඩුව දක්වා ඒකාබද්ධ වේ. අතීතයේ සිටම, ශ්‍රී ලංකාවේ සහ ඉංදියාවේ ග්‍රාමීය පරිපාලන ව්‍යුහය පංචායත් සහ ගම්සභා යන ආයතන හරහා හැඩගැසී තිබුණි.

ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ගම්සභා ක්‍රමයට අඩිතාලම දැමූයේ ඉංදියානු "පංචායත් රාජ්" ක්‍රමය හා ඊටත් පෙර ශ්‍රී ලංකාවේ පැවතුන ග්‍රාමීය පරිපාලන ව්‍යුහයන්ය. පංචායත් හා ගම්සභා ද ග්‍රාමීය පරිපාලන ඒකක ලෙස මතුවී සංවර්ධනය වූ ආයතනයන්ය. ග්‍රාමීය සංවර්ධනය අරමුණු කොට ගෙන මෑතක දී ග්‍රාමීය පරිපාලන ව්‍යුහයට එක් වූ නවතම පරිපාලන ආයතනය වන්නේ "ජනසභා" ය. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සහ ඉංදියාවේ පවතින මෙම ග්‍රාමීය සංවර්ධන පද්ධතියෙහි ඓතිහාසික දියුණුව සහ එහි විකාශණය මෙන්ම එහි සාර්ථකත්වයන් සහ දුර්වලතාවයන් හඳුනා ගැනීම ය. එසේම වර්තමානයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය සභා ක්‍රමය සහ ක්‍රියාත්මකවීමට යෝජිත "ජනසභා" ක්‍රමය යන ග්‍රාමීය පරිපාලන ව්‍යුහය සඳහා "පංචායත්" ක්‍රමය ආදේශකයක් ලෙස යොදා ගැනීමේ හැකියාව විමර්ශනයට ලක් කෙරේ. රාජ්‍ය පරිපාලන පද්ධතියෙහි දක්නට ලැබෙන ශක්තිමත් සහ කාර්යක්ෂම කොටසක් ලෙස ග්‍රාමීය පරිපාලන හා කළමනාකරණ පද්ධතිය හඳුන්වාදිය හැක. ඒවාට අවශ්‍ය බලය සහ ආධිපත්‍ය ලබාදීම තුළින් මෙම ආයතන ස්වයංපාලන රාජ්‍ය වශයෙන් ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව පර්යේෂණයට බඳුන් කිරීම ද මේ තුළින් අපේක්ෂා කෙරේ.
මූලික වශයෙන්, විවිධ අධ්‍යයන තුළින් ගාන්ධිතුමා ග්‍රාමීය පාලන ඒකක පිළිබඳ දැරූ ආකල්ප මෙන්ම ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍රයයන් භාවිතයෙන් ලබාගත් තොරතුරු ද මෙම පර්යේෂණය සඳහා මූලික වශයෙන් පාදක කරගත් අතර විවිධ වකවානුවල ක්‍රියාත්මක වූ සංවර්ධන කටයුතු පිළිබඳ තොරතුරු ද සංසන්දනාත්මකව විග්‍රහයට ලක් කෙරුණි.

එසේ ලබාගත් තොරතුරු සහ නිරීක්ෂණවලට අනුව විසිඑක්වන ශතවර්ෂයේ ග්‍රාමීය පාලන ඒකක ජාලය වැදගත් සහ ප්‍රායෝගික ආයතන පද්ධතියක් ලෙස හඳුනාගත හැකි අතර ගම්සභාවල මුල් ස්තරයේ ඇති රාජ්‍ය ආයතන සංවර්ධනය කිරීම සඳහා පංචායත් වැනි ග්‍රාමීය රාජ්‍ය පාලන තන්ත්‍ර, ඒවායේ ක්‍රමවේද, සංයුතිය හා අන්තර්ගතයන් සාර්ථකව දියත් කිරීම කාලෝචිත වේ. එසේම ග්‍රාමීය පරිපාලනය මාධ්‍යම ආණ්ඩුවේ පරිපාලනය සමඟ යා කෙරෙන පාලමක් ලෙස ඉහත සඳහන් ප්‍රාදේශීය ආණ්ඩුක්‍රමයක් නැවත පණගැන්වීමේ වැදගත්කම සහ එමගින් පූර්ණ සංවර්ධනයක් රටතුළ ඇතිකිරීමේ වැදගත්කම ද මෙම අධ්‍යයනය තුළින් අනාවරණය වේ.

---

**යොමු වචන** - පංචායත් ක්‍රමය, ග්‍රාමීය සංවර්ධනය, ගාන්ධි ආකල්ප, ගම්සභා, ජනසභා, ග්‍රාමීය පරිපාලන ව්‍යුහය, පංචායත් ක්‍රමය සහ ජාතික ව්‍යාපාරය